සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය - 2021 | පැය 03 යි |
| கண்டுபிடிப்பு சோதனை - 2021 | 03 மணி நேரம் |
| Diagnostic Test - 2021 | 03 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය 73-S-II | 13 ශ්‍රේණිය |
| சிங்கள மொழி மற்றும் இலக்கியம் 73-S-II | தரம் 13 |
| Sinhala language and literature 73-S-II | Grade 13 |

අමතර කියවීම් කාලය - විනාඩි 10

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛතාවය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

විභාග අංකය - ........................

උපදෙස් -

I කොටසේ I ප්‍රශ්නයද II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

I ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මේ ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.

I කොටස, II කොටසේ පිළිතුරු පත් සමග අමුණා භාරදෙන්න.

## I කොටස

1. වඩාත්ම ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 සිංහල අක්ෂර මාලාවේ එන ' හ් ' යන්න කවර ගණයකට අයත් අක්ෂරයක්ද?

1. තාලුජ ඌෂ්ම අඝෝෂ
4. කණ්ඨජ ඌෂ්ම ඝෝෂ
2. කණ්ඨජ ඌෂ්ම අඝෝෂ
5. ඕෂ්ඨජ ඌෂ්ම ඝෝෂ
5. තාලුජ ඌෂ්ම ඝෝෂ

(.....)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න

1. ඡන්දස්ශාස්ත්‍රය දර්ශනීය ප්‍රස්තාවෝචිත කාලච්චේද නෂ්ටාවශිෂ්ට
2. ඡන්දශ්ශාස්ත්‍රය දර්ශණීය ප්‍රස්ථාවෝචිත කාලච්ඡේද නෂ්ටාවශිෂ්ඨ
3. ඡන්දශ්ශාස්ත්‍රය දර්ශණීය ප්‍රස්තාවෝචිත කාලච්ඡේද නෂ්ටාවශිෂ්ට
4. ඡන්දස්සාස්ත්‍රය දර්ශනීය ප්‍රස්තාවෝචිත කාලච්ඡේද නෂ්ඨාවශිෂ්ට
5. ඡන්දශ්ශාස්ත්‍රය දර්ශණීය ප්‍රස්ථාවෝචිත කාලච්ඡේද නෂ්ටාවශිෂ්ට

(.....)

1.3 අකාරාදී පිළිවෙල අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. ඉන්දියාව, ලංකාව, ඇමරිකාව, ප්‍රංශය
2. ජපානය, චීනය, රුසියාව, කැනඩාව
3. බ්‍රසීලය, ලිබියාව, සිරියාව, ඉතාලිය
4. පාකිස්ථානය, නෝර්වේ, තුර්කිය, ග්‍රීසිය
5. කුවේට්, කොරියාව, නවසීලන්තය, පෝලන්තය

(.....)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

1. අනුස්වාරය, වචනයක පවතින ස්වරයකට පූර්වයෙන් ද භාවිත වේ.
2. '0' දී වර්ගාන්තාක්ෂර ගණයට ඇතුළත් කල හැකිය.
3. ව්‍යඤ්ජණයකට පසුව අතරක් නොතබාම අනුස්වාරය භාවිත වේ.
4. ස්වරයකට අනුව පවතින බැවින් අනුස්වාර නම් වේ.
5. අනුස්වාරයට පිල්ලම් එක්කල හැකිය.

(.....)

1.5 එකිනෙකට අනුරූප වන සේ යෙදුනු වචන යුගල සහිත වරණය තෝරන්න.

1. මාතෘ උපහාර, ආචාර්ය මණ්ඩලය, ලක් දෙරණ, කිරය අදියර
2. හෘද රෝග ඒකකය, ඒකාබද්ධ විපක්ෂය, පුනර්ජනනීය බලශක්ති, පරිසර ඇමති
3. ජල පවිත්‍රාගාරය, මානුෂීය ආධාර, ජාතික ව්‍යාපාරය, ආයුර්වේද රෝහල
4. වෛද්‍ය විද්‍යාලය, පෙර අඹර, ප්‍රවාහන අංශය, මගී ජනතාව
5. මාර්ග නීති, සමාජ ප්‍රශ්න, මෞලි මංගල්‍යය, රණවිරු උපහාර

(.....)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. පැවිදි, ශ්‍රාවක, සක්වළ, චන්දන
2. ප්‍රතිපත්ති, පිළිබිඹු, පඨවි, ආවාට
3. අභිෂේක, උපදේශ, ආකාර, ප්‍රසිද්ධ
4. වෛද්‍ය, සංවත්සර, ඇදුරු, පිළිමල්
5. විශේෂ, දෙව්ලෝ, ඉඳුනිල්, විදේශ

(.....)

1.7 තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. සැරියුත්, ඉසුරු, මහඹසු, විදුසක්විති
2. ජනගහනය, චේතනාව, මෝහනය, සැඳෑ අඳුර
3. සසර, මිතුර, කතර, උත්තර
4. සාටක, සාගර, තාපස, ආදේශ
5. පසිඳු, ආදේශ, සාගර, පවුර

(.....)

1.8 යථ, කු, ප, න ආදී වර්ගයන්ට අයත් අව්‍ය සාමාස පද පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

1. යථාලාභ, අශෝභන, සුසිරිත්, උපදේශ
2. යථාලාභ, සුසිරිත්, උපදේශ, අශෝභන
3. සුසිරිත්, යථාලාභ, අශෝභන, උපදේශ
4. උපදේශ, සුසිරිත්, යථාලාභ, අශෝභන
5. යථාලාභ, සුසිරිත්, අශෝභන, උපදේශ

(.....)

1.9 කෘදන්තයක් නොවන වචනයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. කැඩුම්, බැලුම්, බිණුම්, රැකුම්
2. පාරන, හාරන, මෝරන, සූරන
3. විසිරුම්, ඇසිරුම්, ඉසිරුම්, හැසිරුම්
4. නටන, බණන, බලන, බසින
5. වැසිලි, බැසිලි, කිසිලි, නැසිල

(.....)

1.10 පහත සඳහන් උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ) **අසතොත්** නිවරද මුනිඳු තෙපුල්මයී

ආ) රඟන ළඳුන් **බල** රූ සිරි සියල්ලී

ඉ) **ගනිති** අය පඬුරු පෙර නියමින්

ඊ) **කියමින්** සොඳ ගී සින්දු

1. විධික්‍රියා, ත්‍රෛකාලික ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
2. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, ත්‍රෛකාලික ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
3. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ත්‍රෛකාලික ක්‍රියා
4. පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ත්‍රෛකාලික ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
5. විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ත්‍රෛකාලික ක්‍රියා

(.....)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. වකුටු, කරටි, පහවි, පැනිති
2. නූතන, සදාතන, අද්‍යතන, මධ්‍යතන
3. දාරුමය, රජතමය, පිළිමය, වජ්‍රමය
4. ගැමි, රැටි, ලෙව්, සැබි
5. ප්‍රියතම, ප්‍රබලතම, උදාරතර, සුළුතර

(.....)

1.12 උපසර්ගයක් යෙදී නොමැති වචන සහිත වරණය තෝරන්න.

1. සුලලිත, සුරිඳු, සුමිතුරු, සුචරිත
2. දුෂ්කර, දුශ්ශීල, දුෂ්පෝෂණ, දුස්සාධ්‍ය
3. නිදොස්, නිතරග, නිකැලැල්, නිවහල්
4. අවවාද, අවජාත, අවගුණ, අවමාන
5. දුර්ගුණ, දුගඳ, දුසිරිත්, දුෂ්කර

(.....)

1.13 නිපාතයක් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

1. කල්හි, සඳ, පටන්, තෙක්
2. සේ, එව්, බඳු, වැනි
3. අන්න, මෙන්න, අතන, මෙතන
4. සඳහා, වෙනුවෙන්, විනිස, පිණිස
5. එක්කෝ, එපා, එහෙත්, අනේ

(.....)

1.14 කාව්‍ය සාහිත්‍යය නංවාලීමට වර්තමාන කවිකිවිඳියන් දක්වනුයේ අල්පෝත්සාහයකි. යන්නහෙි වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරෙන් ඇති පද අයත්වන්නේ කුමන ව්‍යාකරණ අංග වලට ද?

1. තද්ධිත, සන්ධි, සමාස
2. සමාස, තද්ධිත, සන්ධි
3. සන්ධි, සමාස, තද්ධිත
4. සන්ධි, තද්ධිත, සමාස
5. තද්ධිත, සමාස, සන්ධි

(.....)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ ඇතුළත් නොවන ක්‍රියා රූපය සහිත වරණය තෝරන්න.

1. නටද්දී, කියද්දී, මුමුණද්දී, දැමුවොත්
2. කියූහ, දැක්වූහ, පැවසූහ, ලියූහ
3. නැටවූ, කියවූ, දිවූ, කරවූ
4. කරයි, දුවයි, බලයි, කියයි
5. දුවන්න, පනින්න, ඇහෙන්න, කියන්න

(.....)

1.16 සාමාසයක් නොවන වචනයන් ඇතුළත් වරණය තෝරන්න.

1. නිල්දිය, සුදුහුණු, රතුපලස, කළුපැල්ලම
2. තුන්දොස්, තෙමගුල, අටලෝදහම, පසිඳුරන්
3. අහසපොළව, ධනධාන්‍ය, වැව්මුහුදු, පිඟන්කෝප්ප
4. ඇත්ගාල, රාජඅණ, ළමාලොව, සර්පවිෂ
5. පොතපත, මල්දම්, රියගාල්, හිරුසඳු

(.....)

1.17 එකම වර්ගයට අයත් සන්ධිපද ඇතුළත් වරණය තෝරන්න.

1. පොල්ලත්ත, පත්තිරු, ගොක්කොළ, නිල්ලහස
2. දෑස, දෑවර, දෑළ, දෑඟිලි
3. සුළැඟිල්ල, හොරැහින්, මගුලැතු, වෙදැදුරු
4. ධනේශ්වර, තපෝවන, මහෝදර, යුද්ධෝපකරණ
5. ප්‍රත්‍යුපකාර, ජාත්‍යන්ධ, අන්වර්ථ, ලෝකාර්ථ

(.....)

1.18 ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක්ද?

1. වහා, සෙද, නොලසා, සහසා
2. නවදොර, තුන්ලෝ, පස්පියුම්, දසදෙස
3. අත්පා, කඳබඩ, ඇස්කන්, තොලකට
4. කුල්මත්, ප්‍රභාමත්, සෞන්දර්යය, කෞශල්‍යය
5. වැදිලි, බැඳිලි, සිඳිලි, විඳිලි

(.....)

1.19 ව්‍යාකරණානුකූලව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

1. මේ දිනවල පාසලෙහි ශිෂ්‍යයන් නැත
2. ලේඛකයා හෝ ලේඛිකාව පොතක් රචනා කරන්නේය
3. තාක්ෂණය භාවිතයෙන් දරුවන් හොඳින් උගනිතියි දෙමවුපියෝ සිතති
4. දැයට පණදිය හැකි නායනයෙකු පහළ වෙත්වා!
5. මානව හිමිකම් සම්බන්ධ නීතිහු කලින් කල වෙනස් වෙයි

(.....)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න

1. කොළඹ පැත්තෙ මං පහරන්නො ඉන්නවලු
2. ඒ ළමයා උදේ හිටන් වැඩ කරන්නෙ
3. නගරයේ වුන් නිසා දැන් ගම්වලත් ඒ සිරිත් පැතිරෙනවා
4. ඇමති මණ්ඩලේ පදවි වලට හැමෝම මාන බලනවා
5. අනුන්ට දොස් නොකියා තම රාජකාරිය ඉටුකිරීම මැනවි

(.....)